# පවුල් සංස්ථාව පිළිබඳ කෘත්‍යවාදී අදහස්, බෞද්ධ දර්ශනයේ ඉගැන්වීම් ඇසුරෙන් සිදුකරනු ලබන විශ්ලේෂණාත්මක විග්‍රහයක්

**මහකච්චකොඩියේ පඤ්ඤාසේකර හිමි**

## හැඳින්වීම

නූතන සමාජ විද්‍යාත්මක න්‍යායන් අතරින් කෘත්‍යවාදය (Functionalism) හෙවත් කාර්යබද්ධ වාදයට ඇත්තේ සුවිශේෂී ස්ථානයකි. එ මන්ද යත් එය න්‍යායක් පමණක් නොව සමාජ සංසිද්ධීන්වල අන්තර්සම්බන්ධතා සහ ඒවායේ සමාජ කාර්යයන් අවබෝධ කරගැනීමට ඇති ක්‍රමවේදයක් ද වන නිසාවෙනි. ඒ අනුව කෘත්‍යවාදී පර්යාලෝකය සමාජයක කොටස් එහි ස්ථාවරත්වය පවත්වාගෙන යාමට නිර්මිත වී ඇති ආකාරය අවධාරණය කරනු ලැබේ. කෘත්‍යවාදය යන්නෙන් අදහස් කරන දෑ ප්‍රධාන කොටස් හතරක් යටතේ බෙදා දක්වා ඇත.

1. යම් සමාජ එකතුවක පොදු උත්සවයක, හමුවීමක, හෝ රැස්වීමක ආදි අවස්ථාවන්හි ක්‍රියාවක් හෝ මතුවන හැසිරීමක් වශයෙන්.
2. යම් විචල්‍යයන් දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර ඇතිවන සම්බන්ධතාවයෙන් මතුවන්නා වූ අගය හෝ වටිනාකම් එසේත් නැතිනම් ප්‍රතිඵලය.
3. කෘත්‍යය යම් වෘත්තිමය කාර්යයක් වශයෙන් එනම් යම් පුද්ගලයෙකුගේ සුවිශේෂ කාර්යයභාරයන් වගකීම් හෝ වැඩකොටස් වශයෙන්.



4. සමස්තයෙන් කුඩා කොටසක් ගත්විට සමස්තයේ පැවැත්ම සඳහා වැදගත් වන ආකාරය විමර්ශනය කිරීමේ දී හඳුනා ගනු ලබන ක්‍රියාකාරකම් කෘත්‍යයන් සලකනු ලබයි.

මේ අනුව බලන විට කෘත්‍යය යනුවෙන් විවිධ ක්‍රියාකාරකම් රැසක් අදහස් කරනු ලබන බව පෙනේ. කෙසේ වෙතත් මෙය සාරාංශ කොටගත් කල්හි කෘත්‍ය යනු යම් ව්‍යුහයක ක්‍රියාකාරී චක්‍රවානුවක් තුළ ගොඩනැගෙන ප්‍රතිඵල විවිධ සම්බන්ධතාවන්හි තත්ත්වයන් ලෙස පෙන්වා දිය හැකිය.[1] නූතන ලෝකයේ දාර්ශනික ඉගැන්වීම් අතරින් බුදු දහමට ඇත්තේ ද සුවිශේෂී ස්ථානයකි. එයට හේතුව බෞද්ධ ඉගැන්වීම සංසාර දුකෙන් මිදීමේ ඒකායන මාර්ගය වූ නිවන ළඟාකර දෙන්නක් පමණක් නොව මෙලොව ජීවිතයේ මානව සම්බන්ධතා හා මානව ක්‍රියාකරීත්වයන් නිවැරදි පිළිවෙතකට පවත්වා ගන්නේ කෙසේ ද හා එය මානව සමාජයේ පැවැත්ම කෙරෙහි සිදුකරන බලපෑම පෙන්වා දෙන වටිනා ඉගැන්වීමක් ලෙසින් ද හඳුනාගත හැකි නිසාය. එය මානව අන්තර්සම්බන්ධතා හා කාර්යයන් අවබෝධ කරගැනීමේ ක්‍රමවේදයක් වූ කෘත්‍යවාදී න්‍යාය සමග ගැලපෙන්නක් ලෙසින් ද හඳුනාගත හැකිය. ඒ අනුව මෙම අධ්‍යයනයේ පරමාර්ථය වන්නේ කෘත්‍යවාදී දෘෂ්ටිකෝණයෙන් බුදු දහමේ ඉගැන්වීම් හඳුනාගැනීමත්, කෘත්‍යවාදි න්‍යායේ ඇති දුර්වලතා මගහරවා ගැනීමට බුදු දහමේ ඉගැන්වීම් සම්බන්ධ කරගන්නේ කෙසේ ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීමත්ය.

## කෘත්‍යවාදී න්‍යායේ ඓතිහාසික පසුබිම හා සංවර්ධනය


කෘත්‍යවාදයේ ඓතිහාසික පසුබිම අධ්‍යයනය කිරීමේ දී මුලින්ම කෘත්‍යවාදය ජීවවිද්‍යාවන්ට සම්බන්ධ න්‍යායාත්මක විග්‍රහයන් සඳහා දායක වී තිබේ. සමාජයේ කොටස් ඒකරාශි වී ජීව යන්ත්‍රයක් ගොඩනැගෙන ආකාරය එ මගින් හඳුන්වාදී ඇති අතර එම විග්‍රහය 19 වන සියවස වන විට මානවවිද්‍යාවට හා සමාජවිද්‍යාවට වැදගත් විය. මානවවිද්‍යාව කෘත්‍යවාදය සම්බන්ධයෙන් දීර්ඝ ඉතිහාසයක් ඇති විෂයකි. සමාජ මානව

විද්‍යාවේ වැදගත් කෘත්‍යවාදීන් දෙදෙනෙක් වන බ්‍රොනිස්ලෝ මැලිනොවුස්කි (Bronislo Malinowski) සහ ඒ. ආර්. රැඩ්ක්ලිප් බ්‍රවුන් (A.R. Radcliffe Brown) ආරම්භක මානව විද්‍යාඥයින් ලෙසින් සමාජ අන්තර්සම්බන්ධතා කෘත්‍යවාදී න්‍යායෙන් අවබෝධ කරගැනීමට හැකිබව පෙන්වා දෙන ලදි. මැලිනොවුස්කි බහුල වශයෙන් අවධානය යොමු කරන ලද්දේ පුද්ගලවාදී කෘත්‍යවාදයටයි (Individualistic Functionalism). පුද්ගලයා සමාජ සංස්කෘතියේ පැවැත්මට සංස්කෘතිකාංග මුල්කරගන්නා අතර ඒ තුළින් සාමූහිකත්වය සමාජය තුළ ගොඩ නැගෙන බවත් එය සමාජ පැවැත්මට හේතු වන බවත් පෙන්වා දේ. එනම් තම අවශ්‍යතා වන කුසගින්න, ලිංගිකත්වය වැනි කායික අවශ්‍යතා සදාචාරාත්මකව සාමූහික පිළිගැනීමකට අනුව ඉටු කරගන්නට සංස්කෘතික අගනාකම් ඔස්සේ ලැබෙන අනුබලය හේතුවන බවය.[2]


සමාජ මානව විද්‍යාඥයින් අතර කෘත්‍යවාදය සම්බන්ධයෙන් අදහස් දැක්වූ ප්‍රධානතම මානව විද්‍යාඥයා වශයෙන් රැඩ්ක්ලිප් බ්‍රවුන් පෙන්වා දිය හැකිය. ඔහු මැලිනොවුස්කිගේ පුද්ගල කෘත්‍යවාදය ප්‍රතික්ෂේප කරමින් ඩුර්කයිම් විසින් පෙන්වා දුන් ව්‍යුහගත කෘත්‍යවාදි අදහස් කෙරෙහි නැඹුරු විය. ඔහු තම පර්යේෂණය සිදු කරන ලද්දේ පූර්ව කාර්මික සමාජ මුල් කරගෙනය. ඔහුගේ විශ්වාසය වූයේ සමාජ ක්‍රියාකාරකම් එයට අදාළ සමාජයේ හෝ ප්‍රජාවගේ ක්‍රියාකාරීත්වයන් සඳහා වැදගත්වන බවයි. මෙම න්‍යායාත්මක විග්‍රහය ඓන්ද්‍රිය සාදෘශ්‍ය (Organic Analogy) නැමැති සංකල්පය ඔස්සේ විග්‍රහ කරන ලදි. මෙම විග්‍රහය බ්‍රිතාන්‍ය ජාතික සමාජ විද්‍යාඥයකු වූ හර්බට් ස්පෙන්සර්ගේ ඓන්ද්‍රිය සාදෘශ්‍ය සංකල්පය තුළින් විග්‍රහ වූවකි.[3] ඔහුට අනුව ඓන්ද්‍රිය සාදෘශ්‍ය ගොඩනැගෙන අන්දම ජීව විද්‍යාත්මක ඓන්ද්‍රිය වාදයට අනුව පැහැදිලි කරගත හැකිවේ. මිනිසකු නිර්මාණය වීම සඳහා කුඩා සෛල බද්ධවීමෙන් ගොඩනැගුණ අවයව ද, එම අවයව එක්වීමෙන් සකස්වුන අවයව පද්ධතිය ද, එම අවයව එක්වීමෙන් හා ක්‍රියාකාරී වීමෙන් පූර්ණ මිනිසෙක් ද බිහිවන බව මෙම ඓන්ද්‍රිය සාදෘශ්‍ය තුළින් පෙන්වා



දේ. මෙම මිනිසාගේ ව්‍යුහය ප්‍රධානතම උප ව්‍යුහයන් ගණනාවක් නැතහොත් අවයව පද්ධති ගණනාවක් මත පදනම් වී ඇතැයි පෙන්වාදිය හැකිය. එනම්, මෙසේය.




මෙම සියලුම අවයව පද්ධති මනා ලෙස ක්‍රියාකාරී වීමෙන් පුද්ගලයාගේ ජීව විද්‍යාත්මක ව්‍යුහය ගොඩනැගෙන අතර එවන් පුද්ගලයෙකු මනා ක්‍රියාකාරී පුද්ගලයෙක් ලෙස ද හඳුනාගත හැකිය. යම් හෙයකින් එක් අවයව පද්ධතියකින් ඉටුවන කාර්යය නැතහොත් කෘත්‍යයක් ඉටුනොවීමෙන් පුද්ගලයා රෝගයෙකු බවට පත්වන අතර එසේ නොමැතිනම් මියයනු ඇත. මෙසේ සමාජ ව්‍යුහයද ඓන්ද්‍රීය සාදෘශ්‍යට සමාන කරගත හැකිය. ඒ අනුව පුද්ගලයා සමාජය නැමැති දේහයේ කුඩා සෛලයක් වේ. එම කුඩා සෛල රාශියක් එකතු වී අවයවයක් සෑදෙන්නක් මෙන් පුද්ගලයන් රාශියක් එකතු වී සමාජ සමූහ නිර්මාණය වේ. උදාහරණ වශයෙන් පවුල් ඒකක, ඥාති සමූහ, මිතුරු සමූහ, ආගමික සමූහ, දේශපාලනික සමූහ, ජනවාර්ගික සමූහ ආදිය පෙන්වාදීමට හැකිය. ඒවා එකිනෙකට සම්බන්ධ වී ගොඩනැගෙන ආකාරය මෙසේ පෙන්වා දිය හැකිය.[4]




ඉහත සටහන දෙස බැලීමේදී පැහැදිලි වන්නේ සමාජය මනාලෙස සංවිධානය වීමට එහි පැවැත්මට හා වෙනස්වීමට මෙම උප ව්‍යුහයන්ගේ ක්‍රියාකාරීත්වය ඉතා වැදගත් වේ. එමෙන්ම ජෛන්ද්‍රිය සාදෘශ්‍ය දෙස බලන විට සමාජය කෘත්‍යාත්මකව සංවිධානය වී ඇති අන්දම පිළිබඳ යම් අවබෝධයක් ලබා ගත හැකි බව පෙනේ. කෙසේ වුවත් ඔවුන් තම විග්‍රහයෙන් සමාජය පිළිබඳ ප්‍රධාන ගැටලු තුනක් අවබෝධ කරගැනීමට උත්සාහ දරා ඇතැයි පෙන්වා දිය හැකිය. එනම්

1. සමාජ නිර්මාණ වර්ග කීයක් තිබේද?
2. සමාජ නිර්මාණ ක්‍රියාත්මක වන්නේ කෙසේ ද?
3. නව සමාජ වර්ග ඇතිවන්නේ කෙසේද?[5]

මේ ආකාරයට සමාජය අවබෝධ කරගැනීමට විවිධ එළඹුම් රැඩ්ක්ලිප් බ්‍රවුන් විසින් හඳුන්වා දුන්නද එය කෘත්‍යවාදයෙන් බැහැර වී ඇති ආකාරයක් දැක ගත හැකි වේ.

කෘත්‍යවාදයේ ආරම්භය හා විකාශනය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ දී මානවවිද්‍යාවේ විග්‍රහයන් මෙන්ම සමාජ



විද්‍යාවේ විග්‍රහයන් ද ඉතා වැදගත් වේ. සමාජ විද්‍යාත්මක න්‍යායක් ලෙසින් කෘත්‍යවාදී අදහස් සමාජය විග්‍රහ කිරීමට අධ්‍යනයන් සිදු කරන ලද සමාජ විද්‍යාඥයින් ලෙසින් හර්බට් ස්පෙන්සර් (Herbert Spencer), විල්ෆ්‍රෙඩෝ පරේටෝ (Wilfredo Pareto), එමිල් ඩුර්කයිම් (Emile Durkhime), ටැල්කොට් පාසන්ස් (Talcott Parsons) ඉතා වැදගත් වේ. හර්බට් ස්පෙන්සර් ජෛන්ද්‍රිය සාදෘශ්‍ය පදනම් කරගෙන සමාජ විග්‍රහ කරන්නට විය. එහිදී ජීව විද්‍යාත්මක ජීව වස්තු හා සමාජ විද්‍යාත්මක ජීව වස්තු වන විචල්‍යන් දෙක ඔස්සේ කෘත්‍යවාදී සංකල්පයට නව අරුතක් ලබා දෙමින් කෘත්‍යවාදය දියුණු කරන්නට විය. එමෙන්ම පරේටෝ කෘත්‍යවාදය ගොඩනැගීමේ දී සමාජය සමතුලිතාවය මත ගොඩනැගෙන්නක් ලෙසින් හඳුනාගෙන අධ්‍යයනයන් සිදු කරන ලදි. මෙම විග්‍රහය නූතන සමාජ විද්‍යාවේදී ද අවධානය යොමුකරන ලද ප්‍රධාන සංකල්පයකි. නූතන සමාජ විද්‍යාඥයින් ද පිළිගනු ලබන්නේ සමාජ කෘත්‍යයන් ඔස්සේ සමාජ පද්ධතියේ සමතුලිතතාවය ඇති වන බවයි. එමිල් ඩුර්කයිම් යනු කෘත්‍යවාදී න්‍යායේ සුවිශේෂී කාර්යයක් ඉටු කරන ලද සමාජ විද්‍යාඥයෙකි. කෘත්‍යවාදය සම්බන්ධයෙන් ඇති සියලුම මතවාද ප්‍රතික්ෂේප කරමින් කෘත්‍යවාදයට නව මුහුණුවරක් එක් කරන්නට විය. ඔහු පෙන්වා දෙනු ලැබූයේ සමාජයට එයටම අවේනික වූ යථාර්ථයක් පවතින අතර පුද්ගලයන්ද එම සමාජ යථාර්තයට ඇතුලත් වූ කොටසක් බවයි. සමාජයක පුද්ගලයින්ට සමාජය තුළ ක්‍රියාකාරී වීමේදී, සිතීමේ දී හා දැනීමේදී සමාජ කරුණු බලපානු ලැබේ. එසේ බලපෑම් කරන සමාජ කරුණු විග්‍රහකර ගැනීමට ප්‍රධාන මාර්ග දෙකක් පවතින බව ඔහු පෙන්වා දී තිබේ.

1. සමාජ කරුණක් තීරණය වීමට බලපාන්නා වූ හේතු සහ එය ප්‍රභවය වීමට බලපාන ප්‍රධාන සාධක මොනවාදැයි විමසා බැලීම.
2. සමාජ කරුණු සමාජයේ යම් සමාජ කෘත්‍යයක් ගොඩනැගීමේහිලා වැදගත්වන අන්දම විමර්ශනය කර බැලීම.

මේ අනුව හඳුනාගත හැකි වන්නේ සමාජ කරුණු සමාජයක් පවත්වාගෙන යාමට විශාල මෙහෙයක් සිදු කරන බවයි. එයට හේතුව සමාජ කරුණු යමක අවසානය දක්වා ගමන් කිරීමට උපකාරී වී ඇති නිසාවෙනි.[6]

එමෙන්ම ටැල්කොට් පාසන්ස්, වේබර්ගේ හා ඩුර්කයිම්ගේ මතවාදයන් තවදුරටත් දියුණු කරමින් කෘත්‍යවාදී න්‍යාය පෝෂණය කරන ලදි. මේ ආකාරයට කෘත්‍යවාදී න්‍යාය ජීවවිද්‍යාව, මානවවිද්‍යාව, සමාජවිද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන් තුළින් ගොඩනැගුණ බව එහි ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ.

කෘත්‍යවාදී න්‍යායේ සංවර්ධනය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී විශේෂයෙන් ම සෙසු විෂය ධාරාවන්ට වඩා සමාජවිද්‍යා විෂය මුල්කරගත් සංවර්ධනයක් හා විකාශනයක් ඇති බවට කරුණු අනාවරණය කර ගත හැකිය. සමාජ විද්‍යාවේ දී සමාජය සමාජ පද්ධතියක් ලෙසින් සලකා විග්‍රහ කරන අතර එහිදී ඔවුන් වැඩි දුරටත් අවධානය යොමු කර ඇත්තේ සමාජ සමබරතාවය හා අනුකලනය කෙරෙහිය. මෙම මතවාදය ව්‍යුහාත්මක කෘත්‍යවාදය (Structural Functionalism) නමින් හඳුන්වනු ලැබේ. ව්‍යුහාත්මක කෘත්‍යවාදය විග්‍රහකර ගැනීමේ දී ප්‍රධාන කාරණා තුනක් සම්බන්ධයෙන් අවධානය යොමුකළ හැකිය. එයින් ව්‍යුහාත්මක කෘත්‍යවාදය යනු කුමක්දැයි තේරුම් ගත හැකිය. එනම්

1. කුමන අන්දමේ ව්‍යුහයක් සමාජය තුළ අන්තර්ගතවේද? නැතහොත් සමාජය තුළින් හඳුනාගත හැකිද?
2. සමාජය තුළ කුමන ආකාරයේ කෘත්‍යයන් ගොඩ නැගෙන්නේ ද?
3. අන්තර්ගත සමාජ ව්‍යුහයේ කුමන ආකාරයේ කෘත්‍යයන් සක්‍රීය වන්නේද?[7] යනුවෙනි.

එමෙන්ම කෘත්‍ය තවත් ආකාර කිහිපයක් ඔස්සේ විග්‍රහ කරන්නට කෘත්‍යයවාදීන් උත්සාහ ගෙන තිබේ. ඒ අතරින්



මේරියන් ලෙවි කෘත්‍ය ප්‍රධාන කොටස් දෙකක් ඔස්සේ විග්‍රහකර ඇත. එනම්

1. සුකෘත්‍යය (Eufunction)
2. දුෂ්කෘත්‍යය (Dysfunction) යනුවෙනි.[8]

සුකෘත්‍යය යනුවෙන් අදහස් කරනු ලබන්නේ සමාජය විසින් පිළිගත් ක්‍රියාවන් හා එහි භාවිතයන් ය. ඒවා සමාජයේ පැවැත්මට මනාලෙස උපකාරී වේ. මේවා ප්‍රතිජානනාත්මක ක්‍රියාවන් යනුවෙන්ද හඳුන්වනු ලැබේ. දුෂ්කෘත්‍යයන් යනුවෙන් පෙන්වා දී ඇත්තේ සමාජය විසින් බැහැර කළ යුතු යැයි සම්මත වූ ක්‍රියාවන්ය. මේවා නිෂේධනාත්මක සමාජ ක්‍රියාවන් යනුවෙන් ද හඳුන්වනු ලැබේ. මෙම ක්‍රියා හේතුවෙන් සමාජ පාලනය බිඳී ගොස් අපගාමී චර්යාන් නිර්මාණය වී සමාජයේ පැවැත්මට අහිතකර තත්ත්වයන් උදාකර දෙනු ලැබේ. කෘත්‍යවාදී න්‍යායේ සංවර්ධනය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ දී රොබට් කේ මර්ටන්ගේ වර්ගීකරණය ද ඉතා වැදගත් වේ. ඔහු කෘත්‍යය ප්‍රධාන කොටස් දෙකකට වර්ග කර දක්වා තිබේ. එනම්,

01. ප්‍රකට කෘත්‍යයන් (Manifest Functions)
02. නිලීන කෘත්‍යයන් (Latent Functions) යනුවෙනි.[9]

ප්‍රකට කෘත්‍යයන් යනුවෙන් අදහස් කරන්නේ මානව සමාජ විසින් පිළිගත් ධර්මතාවන්ට අනුව හැඩගැසෙමින් තම අරමුණු කරා ලගාවීමේ දී ඇතිවන්නාවූ ප්‍රතිඵලයයි. එය සමාජයේ විද්‍යමාන වන ස්වභාවයක් දැකිය හැකිය. නිලීන කෘත්‍යය යනු, සමාජ කෘත්‍යය තුළින් ඇතිවන ප්‍රතිඵලය විද්‍යමාන නොවන අවස්ථාවන් හැඳින්වීමකි. මේ ආකාරයට කෘත්‍යවාදය සමාජ විද්‍යාවේ න්‍යායක් ලෙසින්, විද්‍යාත්මක ක්‍රමවේදයක් ලෙසින් හා පර්යාලෝකයක් ලෙසින් සංවර්ධනය වී ඇති බව හඳුනාගත හැකිය. කෘත්‍යවාදී අදහස් සමාජ විද්‍යාවේ සමාජ සංසිද්ධි අධ්‍යයනයේ දී යොදාගත් අවස්ථා විෂය අධ්‍යයනයේ දී හඳුනාගත හැකිය. විශේෂයෙන් සමාජ සංසිද්ධි කිහිපයක් මෙහිදි අධ්‍යයනය කිරීමට හැකිවිය. එනම්,

1. පවුල් සංස්ථාව හා කෘත්‍යවාදී පර්යාලෝකය
2. විවාහය සම්බන්ධව ඇති කෘත්‍යවාදී පර්යාලෝකය
3. සමාජ ස්ථරායනය හා කෘත්‍යවාදී පර්යාලෝකය.
4. මානසික චර්යා හා කෘත්‍යවාදී පර්යාලෝකය. යනුවෙනි.

ඉහත සමාජ සංසිද්ධි හා ඒ ආශ්‍රයෙන් ගොඩනැගී ඇති කෘත්‍යවාදී අදහස් අධ්‍යයනයේ දී බෞද්ධ දර්ශනයේ ඉගැන්වීම් ඔස්සේ කෘත්‍යවාදී අදහස් තහවුරු කිරීමත්, තවදුරටත් සංවර්ධනය කිරීමත්, දුර්වලතා ඇති අවස්ථාවන් ඌණ පූර්ණය කිරීමත් මෙම අධ්‍යයනයෙන් සිදු කරන ලදි. ඒ අනුව කෘත්‍යවාදය හා බෞද්ධ දර්ශනයේ ඉගැන්වීම් අතුරින් පවුල පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හා කෘත්‍යවාදය අධ්‍යයනය කරන ලදි.

## 1. පවුල පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හා කෘත්‍යවාදය

පවුල් සංස්ථාව සමාජ විද්‍යාවේ අධ්‍යයනය කරන සංස්ථා අතර ප්‍රධානතම සංස්ථාවකි. මෙය සමාජයේ ප්‍රධාන ආර්ථික ඒකකය ලෙසින්ද හඳුනාගත හැකිය. එමෙන්ම පවුල යනු සමාජයේ කුඩාම ඒකකය වේ. Family (පවුල) යන ඉංග්‍රීසි භාෂාවේ වචනය ලතින් භාෂාවේ Famulus යන වචනයෙන් පරිණාමය වූවක් ලෙසින් පෙන්වාදිය හැකිය. එයින් හඳුන්වන්නේ සේවකයා (Servant) යන්නයි. පවුලක් නිර්මාණය වන්නේ ස්ත්‍රියක් පුරුෂයෙක් හා දරුවන්ගෙන් සමන්විතවන විටය. ඔවුනොවුන් ඔවුනොවුන්ට සේවය කිරීම මෙසේ අර්ථයක් සැපයීමට ප්‍රධාන හේතුවක් ලෙසින් හැඳින්විය හැකිය. නමුත් වර්තමානය වන විට පවුල යන්න පිළිබඳ විවිධ නිර්වචන සපයා ඇත. ඒ අතුරින් ජී. පී මර්ඩොක්ගේ (G.P. Murdock) නිර්වචනයට විශේෂ තැනක් හිමි වේ. ඔහුට අනුව පවුල යනු,

> *"The Family is a group characterized by common residence, economic cooperation and reproduction. In includes adults of both sexes, at least two of whom maintain a socially approved sexual relationship and one or more children own or adopted of the sexually cohabitating adults"*[10]



"පවුල යනු පොදු වාසස්ථානය, ආර්ථික සහයෝගිතාවය, ප්‍රජනනය යන ලක්ෂණවලින් සැදුම්ලත් සමාජ සමූහයකි. මෙයට අයත් වන්නේ සමාජය අනුමත කළ ආකාරයේ ලිංගික සබඳතාවයන් පවත්වන්නා වූ ස්ත්‍රී පුරුෂ වැඩිහිටියන් දෙදෙනෙකුත්, ඔවුනොවුන්ගේ දරුවන් හෝ හදාවඩා ගන්නා ලද දරුවන් ය." යනුවෙන් පෙන්වා දී ඇත.

පවුල පිළිබඳ සමාජ විද්‍යාවේ බොහෝ නිර්වචන ඉදිරිපත් කොට ඇති අතර ඒ අතුරින් තවත් එක් නිර්වචනයක් දෙස අවධානය යොමු කිරීම මෙම අධ්‍යයනයට අවශ්‍ය තොරතුරු සම්පාදනය කරගැනීමට වඩාත් පහසු වේ. ඒ අනුව අර්නස්ට් බර්ගස් හා හාවේ ලොක් විසින් පෙන්වා දී ඇති නිර්වචනයට අනුව පවුල යනු

> *"Family is a group of persons united by ties of marriage blood or adoption constituting a single household interacting and intercommunicating with each other in their respective social roles of husband and wife, father and mother, son and daughter, brother and sister creating a common culture"*[11]

"විවාහය, ලේ වලින් හෝ හදාවඩා ගැනීමෙන් එකට එක්ව ගෘහයක් තුළ ස්වාමියා බිරිඳ, මව පියා, දුව පුතා, සහෝදර සහෝදරිය වශයෙන් අන්තර් ක්‍රියාවේ යෙදෙන සහ ඒ මගින් පොදු සංස්කෘතියක් ඇති කරගන්නා වූ පුද්ගල සමූහයකි." ඉහතින් පැහැදිළි කරන්නට යෙදුණ නිර්වචන දෙස බැලීමේ දී පවුල යන අර්ථකතනය තුළ දැකිය හැකි පොදු වූ ලක්ෂණ කිහිපයක් දැකිය හැකිය. එනම්,

1. පොදු වාසය
2. ආර්ථික සහයෝගීතාවය

3. ප්‍රජනනය

4. අධ්‍යාපනය (සමාජානුයෝජනය) යනුවෙනි.

ඒ අනුව පැහැදිලි වන්නේ පවුල සමාජයේ ඉතා වැදගත්ම ඒකකයක් බවයි. කෘත්‍යවාදී විග්‍රහයට අනුව පවුල යන්න සමාජ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් නිර්මාණය වූවකි. ඒ අනුව පවුල තුළින් ඉටුකරන කාර්යය සමාජ ක්‍රමය පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය වූවකී. පවුල නැමැති ආයතනයෙන් තොරව සමාජය පවත්වාගෙන යා නොහැකි බව කෘත්‍යයවාදීන්ගේ අදහසයි. පවුල් සංස්ථාව නොමැතිව සමාජයේ ව්‍යාකූලතාවයක් ඇතිවිය හැකි බව කෘත්‍යවාදීන්ගේ මතයයි. පවුල් සංස්ථාව පිළිබඳ බෞද්ධ දර්ශනයේ ඉගැන්වීම් ද කෘත්‍යවාදීන්ගේ අදහස් හා මනා ලෙස ගැලපෙන බව හඳුනාගත හැකිය. පවුල සත්ත්ව පරිණාමයේ දී ඇති කර ගන්නා ලද සමාජ සංස්ථාවක් බව පෙන්වා දේ. සත්ත්ව පරිණාමයේ එක්තරා අවස්ථාවකදී, කාලීන වූ මනුෂ්‍ය අවශ්‍යතාවක් සපුරා ගැනීම් වස් පවුලක් ගොඩනැගිණි. තිරිසන් සතුන්ගෙන් වෙන්ව පෞද්ගලික ජීවිතයක් ගතකිරීමේ ශිෂ්ට අදහස ඇතිව ගෙදරක් ගොඩනගා ගැනීමෙන් එය බිහි වූ බව අග්ගඤ්ඤ සූත්‍රාගත තොරතුරුවල ඇතුළත් වේ.[12] මෙසේ ස්ථාපිත පවුල ක්‍රමයෙන් වර්ධනය විය. එහි පරම්පරා තුනකට අයත් සාමාජිකයන්ගෙන් සැදුම්ලත් අවස්ථාවක් පෙළ දහමෙහි ඉදිරිපත් වේ. ස්වාමියා හා භාර්යාව, ස්වාමියාගේ මව පියා, තමන්ගේ දරුවන්, මේ පරම්පරා තුනට අයත් සාමාජිකයෝ වේ. මෙය සමාජ විද්‍යාවේ ඉගැන්වෙන විස්තෘත පවුල් ක්‍රමය වේ. සිඟාලෝවාද සූත්‍ර දේශනවේ පවුලේ පරම්පරාත්‍රයට අයත් සාමාජිකයන් ගැන කියැවේ.[13] උග්ගහ වැනි සූත්‍ර දේශනාවන්වල පවුලේ සාමාජිකයින් ලෙස නැදිමයිලන් හා ලේලිය ගැන සඳහන් වේ. නෑදෑයන් නොවුනත් සේවක පිරිස් ද පවුලේම සාමාජිකයින් ලෙසින් සළකා කටයුතු කරන්නට බෞද්ධ ඉගැන්වීම්වලින් අවධාරණය කර ඇත. මෙයට හේතුව පවුල යනු සමාජ සංවිධානයේ ඇති වැදගත්ම ඒකකය නිසා පවුලේ සදාචාරාත්මක පැවැත්ම සමාජයේ සදාචාරත්මක පැවැත්මට හේතුවක් වන නිසාවෙනි.



කෘත්‍යවාදී න්‍යායට අනුව පවුල තුළින් ඉටුකරන කාර්යය සමාජ ක්‍රමය පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය වූවකි. බෞද්ධ ඉගැන්වීම් තුළින් ද පෙන්වා දෙන්නේ සමාජ ක්‍රමය පවත්වාගෙන යාමට පවුලෙ ස්වාමි භාර්යා හා දෙමාපිය දූදරුවන්ගේ වගකීම් හා යුතුකම් පිළිබඳ අවබෝධය හා ඒවා ඉටු කිරීම අත්‍යවශ්‍ය බවයි. ඒ නිසා ස්වාමියාගේ හා භාර්යාවගේ කාර්යභාරය සවිස්තරව දීඝ නිකායේ සිගාලෝවාද සූත්‍ර දේශනාවේ දක්වා ඇත. ඒ අනුව ස්වාමියා හා භාර්යාවගේ යුතුකම් කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ. ස්වාමියාගෙන් භාර්යාවට ඉටු විය යුතුකම් ශිර්ෂ පහක් යටතේ දක්වා තිබේ. එනම්,

1. ගරු කිරීම (සම්මානනාය)
2. අවමන් නොකිරීම (අනවමානනාය).
3. පරඹුවන් කරා නොයාම (අනතිචරියාය).
4. ගෙදර පාලනය භාර දීම (ඉස්සරියවොස්සග්ගේන).
5. ඇඳුම් පැළඳුම් වැනි අලංකාර දේ දීම (අලඞකාරානුප්පදානෙන).[14]

ඉහතින් පෙන්වා දී ඇති යුතුකම් හා වගකීම් දෙස අවධානය යොමු කිරීමේ දී ස්වාමියා හා භාර්යාව විසින් ඔවුනොවුන් අතර එම වගකීම් හා යුතුකම් ක්‍රියාත්මක වීම ඉටුකිරීම තුළ පවුල් සංස්ථාව ශක්තිමත් කර ගැනීමට හැකියාව පවති. ස්ත්‍රී පූරුෂ සමාජ භාවය අනුව සමාජයේ කාන්තාවට හිමි තැන සමාජ ප්‍රගමනයේ දී ඉතා වැදගත් වේ. අතීතයේ මෙන්ම කාන්තාවට නූතන සමාජයේ ද යම් යම් සමාජ සමූහ තුළ කාන්තාව දුර්වල තැනැත්තියක් ලෙසින් අවමානයට ලක් කරන ආකාරයක් දැකිය හැකිය. එම අවමානය පවුල් සංස්ථාව නැමැති කුඩාම ඒකකයෙන් බැහැර කරන්නට හැකිනම් සමාජ ප්‍රගමනයට එය මහත් කෘත්‍යයක් වනු ඇත. පවුල් සංස්ථාවේ ස්වාමි භාර්යාවන් අතර පැවැතිය යුතු කෘත්‍යයන් පිළිබඳ ගැඹුරු අවබෝධයකින් යුත් බුදුරජාණන් වහන්සේ තම ඉගැන්වීම තුළින් පෙන්වා දී ඇත්තේ ස්වාමියා විසින් හැම අවස්ථාවකදීම භාර්යාවට ගරු කළ

යුතු බවයි. විශේෂයෙන්ම මෙම ගරුත්වය සමස්ථ සමාජයේම කාන්තාවගේ ගෞරවනීයත්වයට හේතු වන බව අවබෝධ කරගත හැකිය. එමෙන්ම ස්වාමියා වෙනත් ස්ත්‍රීන් සමග සංවාසයේ යෙදීම පවුල් ඒකකය තුළ ගැටුම් ඇතිවීමට හේතුවක් ලෙසින් දැක එයින් මුදවා ගැනීමට උපදේශයන් ලබා දී තිබේ. තවද භාර්යාවට ගෙදර සියලු කටයුතු පවරමින් හා ඒවාට සහයෝගය ලබා දීම ද ස්වාමියාගේ වගකීමක් වේ. නූතන සමාජයේ කාන්තාව පුරුෂයා තරම්ම කාර්යබහුල වී ඇත. ඒ නිසා භාර්යාව පමණක් නොව ස්වාමියාද ගෙදර දොර කටයුතු වල දී භාර්යාවට සහයෝගය දැක්වීම ඉතා වැදගත් වේ. කාන්තාව යනු ස්වභාවයෙන්ම අලංකාරයෙන් සිටින්නට ප්‍රිය උපදවයි. කාන්තාව විශේෂයෙන්ම ඇඳුම් පැළඳුම් හා ආභරණවලට විශේෂ කැමැත්තක් දක්වනු ලැබේ. ඒ නිසා ඇයව සතුට කරන්නට ස්වාමියාට සිදු වේ. ඒ මන්ද යත් පවුල් සංස්ථාව ශක්තිමත් කරගැනීමට ඇයව සතුටු කිරීම හේතු වන බැවිණි. ඒ නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ භාර්යාවට ස්වාමියා විසින් අලංකාරමත් ඇඳුම් හා ආභරණ ලබා දීම සිදු කළ යුතු බවයි.

එසේම භාර්යාවද ස්වාමියා වෙනුවෙන් ඉටු කළ යුතු කෘත්‍යයන් කිහිපයක් පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වලින් හඳුනාගත හැකිය. සිගාලෝවාද සූත්‍ර දේශනාවේදී පෙන්වා දී ඇත්තේ ස්වාමියාගෙන් යුතුකම් ඉටු කර ගන්නා භාර්යාව විසින්ද ස්වාමියා වෙනුවෙන් වගකීම් කිහිපයකින් සංග්‍රහ කළ යුතු බවයි. ඒවා නම්,

1. මැනවින් ගෙදර කටයුතු කිරීම.
   (සුසංවිහිත කම්මන්තා)
2. පිරිවර ජනයාට හොඳින් සංග්‍රහ කිරීම
   (සුසංගහිත පරිජනා)
3. වෙනත් පිරිමින් කරා නොයාම(අනතිචාරිනි)
4. උපයාගෙන ඇති වස්තුව රැක ගැනීම.
   (සම්භතං අනුරක්ඛති)



5. හැම කාර්යක්ම දක්ෂව කිරීම.
   (දක්ඛා ච හොති අනලසා සබ්බ කිච්චේසු)[15]

මෙම වගකීම් දෙස බැලීමේ දී අවබෝධ කරගත හැක්කේ භාර්යාව විසින්ද ස්වාමියා කෙරෙහි විශේෂ අවධානයකින් සිටිය යුතු බවයි. ස්වාමියා සතුටු කිරීම පවුල් සංස්ථාවේ පැවැත්මට මනා ලෙසින් හේතු වන බෞද්ධ ඉගැන්වීම් තුළින් හඳුනාගත හැකිය. ස්වාමියා සතුටට පත්වන්නේ භාර්යාව විසින් ගෙදරදොර කටයුතු මැනවින් ඉටු කරමින්, ස්වාමියාගේ ඥාතීන්ට හා හිතමිතුරන්ට මනා කොට සංග්‍රහ කිරීම් ආදිය වෙනුවෙන් තම භාර්යාව කැපවී සිටිනු දැකීමෙනි. එමෙන්ම වෙනත් පිරිමින් කරා නොයෑමත්, හරි හම්බකරගත් වස්තුව විනාශ නොකර රැක ගැනීමත්, කම්මැළිකමක් නොමැතිව සියලු කටයුතුවල දී භාර්යාව දක්ෂව ක්‍රියාකිරීමත් යන කෘත්‍යයන් නිසා ස්වාමියාගේ අවධානය පවුල වෙනුවෙන් යොමු කරගත හැකි බව බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් තුළින් හඳුනාගත හැකිය. මෙම සියලු කරුණු අනුව පැහැදිලි වන්නේ පවුල් සංස්ථාවේ කෘත්‍යය සමාජ ක්‍රමයේ පැවැත්මට මහත් පිටුවහලක් වන බවයි. ඉටු කළ යුතු එම කෘත්‍යයන් මොනවාද යන්න බෞද්ධ ඉගැන්වීම් ඔස්සේ හඳුනා ගැනීමට හැකි වීම මෙම අධ්‍යයනයේ දී සාධනය කරගත් අරමුණක් වේ.

කෘත්‍යවාදී පර්යාලෝකයෙන් පවුල් සංස්ථාව දෙස බැලීමේ දී ස්වාමි භාර්යා දෙදෙනාගේ කාර්යය පවුල් සංස්ථාවේ පැවැත්මට හේතුවනවා සේම දෙමාපිය දූදරුවන්ගේ කෘත්‍යයද පවුල් සංස්ථාව ශක්තිමත් කරගන්නට අතිශයින්ම බලපානු ලැබේ. මිනිසෙකු වශයෙන් පුද්ගලයෙකු මෙලොව එළිය දකින්නේ පවුල නැමැති සමාජ සංස්ථාව තුළය. කුඩා කළ සිටම මව්පිය ඇසුරෙන් පෝෂණය ලබාගැනීම දරුවෙකු සතු අයිතියකි. එම අයිතිය දරුවට ලබා දීමට දෙමාපියන් බැඳී සිටිනු ඇත. පවුල් සංස්ථාව ශක්තිමත් කරගන්න දෙමාපියන් විසින් දූදරුවන් වෙනුවෙන් ඉටු කළ යුතු කෘත්‍යයන් ආකාර පහකින් සිගාලෝවාද සූත්‍ර දේශනාවෙන් බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත.

1. දරුවන් වරදින් වැළැක්වීම (පාපා නිවාරෙන්ති).
2. දරුවන් යහපතෙහි පිහිටුවීම (කල්‍යාණෙ නිවෙසෙන්ති).
3. ශිල්පයක් පුහුණු කරවීම (සිප්පං සික්ඛාපෙන්ති).
4. සුදුසු කළ අවාහ විවාහ සම්බන්ධතා ඇති කර දීම (පතිරූපෙන දාරෙන සංයෝජෙන්ති).
5. නිසි කළ දායද පවරා දීම (සමයේ දායජ්ජං නියයාදෙන්ති).[16]

මෙහි සඳහන් පළමු කරුණු දෙකින් අධ්‍යාපනය ද ශිෂ්ට සමාජයෙහි ජීවත් වීමට අවශ්‍ය සදාචාර පුහුණුව ද, අවධාරණය කෙරේ. ජීවත් වීමේ දී මූලික වශයෙන් අවශ්‍ය දැනුම හා අවබෝධය ද, මිනිසකු වශයෙන් හැසිරීම සඳහා ආචාර ධර්ම පුහුණුව ද, පළමුව මවුපියන් ඇසුරෙන් ලැබේ. තෙවැන්න ජීවිකාව ගෙන යෑම සඳහා පදනම් වන වෘත්තියක් අරමුණු කරගත් ශිල්පීය අධ්‍යාපනයක් දීමයි. වර්ගයාගේ පැවැත්මට ද, මූලික මිනිස් අවශ්‍යතා සන්තර්පණයට ද ශිෂ්ට සම්මත ආකාරයෙන් දරුවන් ප්‍රවේශ කරවීම අරබයා මව්පියන් සතු වගකීම් සිව්වැනි කරුණින් මතු කෙරේ. පවුලක පැවැත්ම ආර්ථිකය මත ගොඩ නැගෙන්නකි. පාරම්පරික සම්බන්ධය අඛණ්ඩව ගෙන යෑමේ ක්‍රමයක් වුවද දායාද පවරා දීම වනාහි අලුතින් පවුල් ජීවිතයකට පදනම දමන දරුවන්ට මූලික වශයෙන් ගොඩනගා ගත යුතු ආර්ථික සුරක්ෂිතතාව සලසා දීම තහවුරු කෙරෙන්නකි.[17] මවුපියන් සතු කාර්යභාරය ඔවුනොවුනගෙන් නිසි අයුරින් ඉටුවන පවුලක දරුවන් විසින් ද ස්වකීය වගකීම් භාරය නොපිරිහෙළා ඉටු කළ යුතුව පවතී. ඒ අනුව දරුවන්ගෙන් දෙමාපියන් වෙත ඉටු විය යුතු කෘත්‍ය පහක් සිගාලෝවාද සූත්‍ර දේශනාවෙන් පෙන්වා දී තිබේ. එනම්

1. මව්පියන් පෝෂණය කිරීම (භතො නේසං භරිස්සාමි)
2. මවුපියන් සතු වැඩ කටයුතු සපුරාලීම (කිච්චං නේසං කරිස්සාමි)
3. පවුලේ හා පරපුරේ ගෞරවය ආරක්ෂාවන පරිදි හැසිරීම (කුලවංසං ඨපෙස්සාමි)



4. දායාදය මැනවින් පරිහරණය කිරීම (දායජ්ජං පටිපජ්ජාමි)
5. කලුරිය කර පරලොව ගිය මවුපියන්ට දන් දී පින් දීම (අථ යා පන පෙතානං කලකතානං දක්ඛිනං අනුපදස්සාමි)

පවුල් සංස්ථාව මැනවින් ආරක්‍ෂා වී සමාජයේ පැවැත්මට කරන කෘත්‍ය අතර දෙමාපිය දූදරු සම්බන්ධතාවය ඉතා වැදගත් වේ. දරුවන් විසින් මෙම කෘත්‍යයන් ඉටු කරදීම දෙමාපියන්ගේ අපේක්ෂාවක් බව පෙන්වා දී තිබේ. මෙසේ දරුවන් යුතුකම් ඉටු කිරීම තුළින් මවුපියන් දරුවන්ට ආශිර්වාද කරන අතර එය දරුවන්ගේ දියුණුවට බලපාන බවද බෞද්ධ ඉගැන්වීම්වල දක්නට ලැබේ.[18]

පවුල් සංස්ථාව මැනවින් ක්‍රියාත්මක වී සමාජ පවැත්ම ශක්තිමත් කරන්නට තවත් ආයතන කිහිපයක සහයෝගය අවශ්‍ය බව සිගාලෝවාද සූත්‍රයේ ඉගැන්වීම් තුළ දක්නට ලැබේ. එයට අනුව මිත්‍ර සංස්ථාව හා පැවිදි සංස්ථාව එයින් දෙකකි. මිත්‍රත්වය බුදු දහමේ ඉතා පෘථුල සංකල්පයකි. මිතුරන් හා පසමිතුරන් අතර ඇති අන්‍යෝන්‍ය සහයෝගය මත සමාජය සදාචාරවත් කර ගත හැකි බව බුදු දහමේ පෙන්වා දී තිබේ. එමෙන්ම පවුල් සංස්ථාවේ දියුණුව උදෙසා රජය විසින් ද ඉටු කළ යුතු කෘත්‍ය ගණනාවක් පිළිබඳ ඉගැන්වීමක් චක්කවත්ති සීහනාද සූත්‍ර දේශනාවෙන් දැකගත හැකිය. එහි දැක්වෙන ආකාරයට ධනය බෙදා හැරීමේ අසාධාරණ ක්‍රමය නිසා ඇතැම් නිර්ධනීහු සොරකමට බටහ. රජු ඉදිරියට පමුණුවනු ලැබූ සොරා තමා සොරකමට පෙළඹුණු හේතුව වශයෙන් කියා සිටියේ ජීවත් වීමට ක්‍රමයක් නැති බවයි. රැකියා විරහිත බව සමාජ අපගාමීත්වයට හේතුවන බව ඉන් ධ්වනිත වේ. සොරාගේ ගැටලුවට විසඳුමක් ලෙසින් දඬුවම් කිරීම නවතා රජු සොරාට ධනය ලබා දී ධනය අරගෙන කර්මාන්තයක් කරමින් අඹුදරුවන් දෙමාපියන් මහණ බමුණන් පෝෂණය කරන ලෙසට අවවාද ලබා දේ. මෙයින් ද වඩාත් පැහැදිලි වන්නේ පවුල් සංස්ථාවේ ආර්ථිකය ශක්තිමත් වන තැන සමාජයේ ප්‍රගමනයට ගැටලුවක් නොවන බවයි.

25 MAY 2022

## ආන්තික සටහන්


1. කරුණාතිලක, කේ. (2010) සමාජ විද්‍යා න්‍යාය, කඩවත: මාලිංග ප්‍රකාශකයෝ. පි. 44
2. Abraham, M. F. (1982) *Modern Sociological Theory an Introduction*, New York: Oxford University Press. 73-74p.
3. Barnard, A. and Bugess, T. (1996) *Sociology Explained*, Cambridge: Cambridge University. 4-5p.
4. කරුණාතිලක, කේ. (2010) පි. 38-39
5. බොටමෝර්, ටී. බී. (1969) සමාජ විද්‍යාව, කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. පි. 30
6. Haralambos, M. and Heald. R.M. (1992) *Sociology Theory and Perspective*, Cambridge: University Tutorial press Limited. 524-525p.
7. Abraham, M. F. (1982) *Modern Sociological Theory An Introduction*, New York: Oxford University Press. 75p.
8. Levy, M. (1952) *The Structure of Society*, Princeton: Princeton University Press. 56p.
9. Merton, R. K (1957) *Social Theory and Social Structure*, New York: Free Press. 51p.
10. Murdock, G.P. (1946) *Social Structure*, New York: Macmillan.
11. Burgess, E. and Locke, H. (1963) *The Family from Institution to Companionship*, Locke Harvey and 3rd (ed), Cincinnati :American Book Company. 16p.
12. දීඝ නිකාය 3, අග්ගඤ්ඤ සූත්‍රය, සම්බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්තමාලා, පි. 150.
13. දීඝ නිකාය 3, සිගාල සූත්‍රය, සම්බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්තමාලා, පි. 302.
14. එම, පි. 306.
15. එම,
16. එම,
17. හෙට්ටිආරච්චි, ඩී. (2013) බෞද්ධ සමාජ විද්‍යා ප්‍රවේශය, කොළඹ 10: දයාවංශ ජයකොඩි සහ සමාගම. පි. 93-94.
18. අංගුත්තර නිකාය 03, ලිච්ඡවි කුමාර සූත්‍රය, සම්බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්තමාලා, පි. 120.